Director News/ News Editor 2015.12.22

# ප්‍රවෘත්ති නිවේදනය

## ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව - 2015 තුන්වන කාර්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේ තුන්වන කාර්තුව සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය පාදක කර ගනිමින් රැකියා නියුක්ති, රැකියා වියුක්ති සහ ශ්‍රම බල සංඛ්‍යාති එකතුවක් නිකුත් කර ඇත. ශ්‍රම බල සමීක්ෂණය මඟින් තුන්වන කාර්තුව සඳහා මුළු රටම ආවරණය වන පරිදි තෝරාගත් ගෘහ ඒකක 6,250ක පමණ පුද්ගලයින්ගේ තොරතුරු එක්රැස් කර තිබේ.

ශ්‍රී ලංකාව සඳහා වැඩ කරන වයස ලෙස නිර්වචනය කර ඇත්තේ වයස අවුරුදු 15 සහ ඊට ඉහළ වයස් කාණ්ඩයන්ය. වැඩ කරන වයසේ මුළු ජනගහනයෙන් අදාල සමීක්ෂණ යොමු කාලය තුළ රැකියා නියුක්ති, රැකියා වියුක්ති මුළු ජනගහනය ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය ලෙස හඳුනාගෙන ඇත. 2015 වර්ෂයේ තුන් වන කාර්තුවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මිලියන 9.0ක් පමණ වේ. එයින් සියයට 64.5ක් පුරුෂයින් වන අතර සියයට 35.5ක් ස්ත්‍රීන් වේ.

තවද, වැඩකරන වයසේ ජනගහනයෙන් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී පුද්ගලයින් ගණන ශ්‍රම බලකාය ලෙසද හැඳින්වේ. එම ශ්‍රම බලකාය, වැඩ කළ හැකි වයසේ ජනගහනයේ (වයස අවුරුදු 15 සහ ඊට වැඩි) ප්‍රතිශතයක් ලෙස දැක්වූ කළ ශ්‍රම බලකා සහභාගීත්වතා අනුපාතය (LFPR) ලෙස හැඳින්වේ. සමීක්ෂණ ප්‍රතිඵල පෙන්වා දෙන ආකාරයට තුන් වන කාර්තුවේ මුළු ශ්‍රම බලකා සහභාගීත්වතා අනුපාතය සියයට 53.8කි. එම අනුපාතය පුරුෂයින් සඳහා සියයට 74.7ක් වන අතර ස්ත්‍රීන් සඳහා සියයට 35.7ක් වේ.

රැකියා නියුක්තිකයන් යනු සමීක්ෂණ කාලය තුළ අවම වශයෙන් එක් පැයක්වත් ආර්ථික කටයුත්තක (වැඩක) යෙදුණ සේවකයින්, සේවා යෝජකයන්, තමාගේම ආර්ථික කටයුත්තක නියැලෙන්නන් හෝ පවුලේ ආර්ථික කටයුත්තකට දායක වන්නන් වේ. 2015 වසරේ තුන් වන කාර්තුව සඳහා කරන ලද ඇස්තමේන්තු අනුව රැකියාවක නියුතු පුද්ගලයින් සංඛ්‍යාව මිලියන 8.5ක් වන අතර එයින් සියයට 45.5ක් සේවා අංශයට ද සියයට 27.2ක් කර්මාන්ත අංශයට ද සහ සියයට 27.4ක් කෘෂිකාර්මික අංශයට ද අයත්වේ. ඒ අනුව වැඩිම රැකියා නියුක්තිය සේවා අංශය වන අතර අඩුම රැකියා නියුක්තිය කර්මාන්ත අංශය වේ. ස්ත්‍රී පුරුෂ වශයෙන් ගත් කළද මෙම තත්ත්වයේ වෙනසක් දැකිය නොහැක. එමෙන්ම සමීක්ෂණ වාර්තාව පෙන්වා දෙන ආකාරයට වැඩ කරන ජනගහනයෙන් සියයට 67ක් පමණ සතියකට පැය 40කට වඩා වැඩ කරනු ලබයි.

සමීක්ෂණ යොමු කාලය තුළ රැකියාවක් නොකරන නමුත් රැකියාවක් සොයමින් සිටින, සමීක්ෂණ දිනට පෙර සති 4 තුළ රැකියාවක් සෙවීමට පියවර ගනු ලැබූ සහ ඉදිරි සති දෙක තුළ කිසියම් රැකියාවක් ලැබුණහොත් භාර ගැනීමට සූදානම් පුද්ගලයින් විරැකියාවෙන් පෙළෙන්නන් ලෙස හඳුනාගෙන ඇත. මුළු

ශ්‍රම බලකායෙන් විරැකියාවෙන් පෙළෙන ප්‍රතිශතය විරැකියා අනුපාතය ලෙස හැඳින්වේ. 2015 තුන් වන කාර්තුව සඳහා ඇස්තමේන්තුගත විරැකියා අනුපාතය සියයට 5.0කි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා විසින් පෙන්වා දෙන ආකාරයට තුන් වන කාර්තුව සඳහා තරුණ (වයස අවුරුදු 15-24) විරැකියා අනුපාතය සියයට 22.9ක් වන අතර පුරුෂයින් සඳහා සියයට 20.3ක් ද ස්ත්‍රීන් සඳහා 26.8ක් ද වේ. එමෙන්ම මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල පෙන්වා දෙන ආකාරයට විරැකියාවේ ඉහළම අගය පෙන්නුම් කරනුයේ අ.පො.ස උසස් පෙළ සමත් සහ ඊට ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබා ගත් පුද්ගලයින් අතරය. එම අනුපාතය පුරුෂයින් සඳහා සියයට 6.0ක් වන අතර එම අනුපාතය ස්ත්‍රීන් සඳහා සියයට 14.1ක් වේ. මෙම වසරේ තුන්වන කාර්තුවේ ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත. (www.statistics.gov.lk)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක- 011-2147001/011-2147446